# 07 ශ්‍රේණිය

# ඉතිහාසය

## පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර - ඉන්දුනිම්න ශිෂ්ටාචාරය



අන්තර්ගතය හා සැකසුම -
රසික ප්‍රියදර්ශන - ව/ ඉ/ රිදී/ උදන්විට මහා විද්‍යාලය, මැල්සිරිපුර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## හැඳින්වීම .....

- ක්‍රි.පූ. 2500 -1500 අතර කාලයේ ඉන්දියාවේ සින්දු ගඟ ඇසුරු කරගෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිහි විය.
- මෙහි ප්‍රධාන නගර
  - ✓ මොහොන්ජො-දාරෝ
  - ✓ හරප්පා
- මේවා පුර නමින් ද හැඳින්වේ.
- පුර හෙවත් පුරය යන්නෙහි අර්ථය නගරය වේ.
- නාගරික ශිෂ්ටාචාරවල දක්නට තිබූ විශේෂ ලක්ෂණය වූයේ ***පුර සංකල්පය*** යි.

# හැඳින්වීම - ඉන්දුනිම්න ශිෂ්ටාචාරය

## පුර සංකල්පයට අදාළ ප්‍රධාන සාධක

- ප්‍රාකාර
- පාර දෙපස කණු පද්ධති
- ඍජු රේඛාමය මං මාවත්
- වීදි ආලෝකය
- ක්‍රමවත් ජලාපවහන ක්‍රමය
- මග දෙපස පාරට යාව තැනූ තට්ටු ගෙවල්
- සෑම නිවෙසකටම වැසිකිළි පහසුකම් තිබීම



## පිහිටීම

### සින්දු නදියේ ගීතය

- මෙම ශිෂ්ටාචාරයට අයත් භූමිභාගය අද ***පාකිස්තානයට*** අයත් ය.
- 1947 දී ඉන්දියාවෙන් වෙන් වන තුරුම මෙම භූමිභාගය ද ඉන්දියාවේ කොටසක් ලෙස පැවතිණි.
- මෙම ශිෂ්ටාචාරයට සින්දු ගංගාවේ සිට සැලකිය යුතු තරම් දුරකට පැතිර තිබූ බවට දැන් සාධක ලැබී ඇත.
- එසේ බලන විට විශාලතම ප්‍රදේශයක පැතිරුණු පැරණි ශිෂ්ටාචාරය ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ලෙස සැලකිය හැක.



## පිහිටීම

### සින්දු නදීයේ ගීතය






## පාලන ක්‍රමය

### සින්දු නදීතෙර මළවුන්ගේ ගොඩැල්ල

- ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර දෙක
  - මොහෙන්දජෝ-දාරෝ (මෙහි අර්ථය මළවුන්ගේ ගොඩැල්ල)
  - හරප්පා
- ශිෂ්ටාචාරයට අයත් තවත් ප්‍රධාන නගර
  - චන්හුදාරෝ
  - ලෝතාල්
  - බලිබන්ගන්
  - අලම්ගීර්
  - රූපාර්

*මොහෙන්දජෝ-දාරෝ හා හරප්පා නගර තරම් විශාල නොවේ.*

# ආර්ථික තත්ත්වය

## උපයෝගැනීම

- ස්වාභාවිකව වැස්ස සහ ගංගාවලින් ලැබුණ ජලය හැර වාරි කාර්මික ක්‍රමයකින් ජලය ගොවිතැනට යොදා ගන්නට ඇත්දැයි කීමට සාධක නැත.
- නගරයේ උස් බිමක සකස් කර තිබු විශාල ගොඩනැගිල්ල ධාන්‍යාගාරයක් වී යැයි ද විශ්වාස කෙරේ.



ලෝතාල් නගරය

- සින්දු නදිය මුවදොර පිහිටි *ලෝතාල්* නම් ස්ථානය එම ශිෂ්ටාචාරයේ වරායක් විය හැකි යැයි විශ්වාස කෙරේ.
- විදේශ සම්බන්ධතා ද පැවතුණ බව ඉතිහාසඥයන්ගේ අදහස යි.

# ආර්ථික තත්ත්වය

උපයාගැනීම

- ඉන්දුනිම්න ශිෂ්ටාචාරයෙහි ආර්ථික තත්ත්වය රඳා තිබූ කරුණු
  - ✓ කෘෂිකර්මාන්තය
  - ✓ වෙළෙඳාම



- ඉන්දුනිම්න ශිෂ්ටාචාරයෙහි ගොවිබිම්වල වගා කරන ලද ධාන්‍ය
  - ✓ තිරිඟු
  - ✓ බාර්ලි
  - ✓ ඉරිඟු

- ගවයන් පාලනය ගැන දැන සිටි බව ඉතා පැහැදිලි ය. පස සකස් කිරීමේ කාර්යයට මෙම සතුන් යොදා ගන්නට ඇත.

## නොවෙනස් නගරය

- **මොහෙන්දජොදාරෝ** සහ **හරප්පා** යන නගර දෙකේ ම සැලැස්ම ඒකාකාර ය.

- නගර දෙකේ ම ඇතුළු නගර ඇත.

- ඒ තුළ යාර 10 ක් 15ක් පමණ උසින් යුත් යාර 400×200 පමණ පමණ ක්ෂේත්‍ර ඵලයක් සහිත වේදිකාවකි.

- මේවා සමහර විට පාලන මධ්‍යස්ථාන වන්නට ඇත.



හරප්පා නගර දොරටුව

## නොවෙනස් නගරය

- මෙම නගරවල ඇති විශේෂ ලක්ෂණයක් නම් ***දීර්ඝ කාලයක් තිස්සේ නොවෙනස්ව පැවතීම*** යි.

- එකල නිදහස් පාලනයකට වඩා දරදඬු මධ්‍යගත රාජ්‍ය පාලන ක්‍රමයක් පැවතිණ.



මොහෙන්දජෝ-දාරෝ නගරය

## සමාජ තොරතුරු

### ගෙවල් දොරවල්

- සමාජයෙහි පාලකයන්, පූජකයන් හා වෙළෙඳුන් ද සිටි බවට සාධක ඇත.

- නගරයේ සුව පහසු ගෙවල්වල සිටි වෙළඳ ප්‍රජාවට වෙනත් ශිෂ්ටාචාරයන්හි නැති ප්‍රමුඛතවයෙන් මෙහි තිබෙන්නට ඇතැයි විශ්වාස කෙරේ.



## සමාජ තොරතුරු

ගෙවල් දොරවල්

**ඉන්දුනිම්නයේ පැවති විධිමත් නගර සැලසුමක් තිබූ බවට සාධක (වඩාත් දියුණු නාගරික ශිෂ්ටාචාරයක් වූ බව )**

- බෙදී ගිය වීථි
- පෙදෙස් පාර දෙපස කාණු පද්ධති
- පොදු නාන තටාක
- එක ම සැලසුමේ නිවාස පේළි
- සෑම නිවසක ම වැසිකිළි පහසුකම් පැවතී ම



## ආහාර රටාව

කා බී සිනහසුණු මිනිසුන්

- ජනයාගේ ප්‍රධාන ආහාර වර්ග
  - ✓ බාර්ලි
  - ✓ මිල්ට්
  - ✓ තිරිඟු
  - ✓ සෝගම්

- ඇති කරනු ලැබූ සතුන්
  - ✓ ගවයින්
  - ✓ එළුවන්
  - ✓ ඌරන්

- මෙම සතුන්ගේ මස් ආහාරයට ගන්නට ඇතැයි සිතිය හැක.



# විනෝදාංශ

## කා බී සිනහසුණු මිනිසුන්

- නෂ්ටාවශේෂ අතුරින් එක් එක් ප්‍රමාණයේ දාදු කැට කිහිපයක් හමු වී ඇත.
- මේවායින් එකල ජනයා විනෝදයෙන් හා විවේකයෙන් සිටි අවස්ථාවල දී දාදු වැනි ක්‍රීඩාවන්හි නිරත ව සිටි බව පැහැදිලි වේ.
- උසස් ජීවන මට්ටම පැවති සමාජයක ලක්ෂණ මෙම විනෝද ක්‍රීඩා අපට කියා පායි.

# ආගමික ඇදහිලි හා විශ්වාස

## වැඳුම් පිදුම්

වඩාත් ම ජනප්‍රිය වන්දනාව ***"මව් දෙවගන පිදීම"*** යි. මව් දෙවගනගේ මැටි රූප කිහිපයක් මෙම ශිෂ්ටාචාරයේ නෂ්ටාවශේෂ අතරින් හමු වී ඇත.

පුරුෂ දේව වන්දනය වෘක්ෂ වන්දනාව ද ඇතුළු තවත් ඇදහිලි ක්‍රම කීපයක් තිබුණි.

ආගමික වතාවත් කළ පූජකයන් ද සිටි බව විශ්වාස කෙරේ.එක් උරයක් වැසෙන සේ ඇද 'රැවුල වවා' නළල් පටයක් බැද සිටින ආකාරය නිරූපණය කරන උඩුකය පමණක් ඇති ප්‍රතිමාව එවැනි පූජකයෙකුගේ එකක් යැයි විශ්වාස කෙරේ.

# විද්‍යාව හා තාක්ෂණය දැනුම

## විස්කම් දස්කම්

- නශ්ටාවශේෂ අතුරින් සොයා ගත් **සෙල්ලම් කරත්ත,** රෝද සවි කරන ලද ඒවා ය.
- ඒවායින් පෙනෙන්නේ රෝදය ගමනාගමන හා ප්‍රවාහනය ක්ෂේත්‍රය සඳහා උපයෝගි කර ගැනීමට දැන සිටි බව ය.
- ආභරණ තැනීමේ කලාව මෙකල විසුවෝ දැන සිටිය හ.
- ලෝහ වාත්තු ශිල්පය ද දැන සිටි බවට සාධක තිබේ.
- මෙහි භාවිත වූ මුද්‍රාවල නිමාව අනෙකුත් කලා ශිල්පවලට වඩා උසස් බවක් දක්වයි.



## විද්‍යාව හා තාක්ෂණය දැනුම

### පුර වස්තුව

- ඉන්දු නිම්නයෙහි පැවති තවත් විශිෂ්ට ඉංජිනේරු ශිල්පයක් වුයේ නගර නිර්මාණය යි.
- ධාන්‍යාගාරයක් සහ කර්මාන්ත පුරයක් ලෙස හැදින්විය හැකි පෙදෙසක් ද නගරයේ කෙළවරක පිහිටා තිබෙන්නට ඇත.
- කර්මාන්තවලින් ඉවත දමන සුන්බුන් රාශියක් මෙහි දී සොයා ගෙන තිබේ.



# විද්‍යාව හා තාක්ෂණය දැනුම

## පුර වස්තුව

- වටිනා ගල් වර්ගවලින් තනන ලද මාල
- කැස්බෑ ලෙලි වැනි අමුද්‍රව්‍යවලින් තනන ලද අරුමෝසම් බඩු
- ඔප දමන ලද පිඟන් බඩු
- රන් භාණ්ඩ

මෙහි පැවති බවට සාක්ෂි දරයි.





## සංස්කෘතිය

### තාක්ෂණයේ සැඟව ගිය කලාව



- ගෘහ නිර්මාණය පිළිබඳ මෙම ශිෂටාචාරයේ වැසියන්ගේ හැකියාව ඉතා ප්‍රබල ය.
- එහෙත් මෙම ගොඩනැගිලි අලංකරණය සඳහා කළ නිර්මාණ ලෙස සැලකිය නොහැකි ය.
- ඒවා විවිධ ප්‍රයෝජන සඳහා ශක්තිමත් ව ඉදිකොට ඇත.

## සංස්කෘතිය

### තාක්ෂණයේ සැඟව ගිය කලාව



- ප්‍රතිමා කලාවට නිදසුන් ලෙස පුරුෂයෙකුගේ හිස, උඩුකය සහ කවන්ධ රූප තුන පෙන්වා දිය හැකිය.
- ඒ කිසිවක් කලාත්මක නිර්මාණ නොවේ. නළඟනකගේ රූපය ද කලාත්මක ස්වරූපයක් නොගනී.
- මෙකල නිර්මාණය කළ චිත්‍ර හෝ කැටයම් දක්නට නැත.

# ලේඛන කලාව

## ලියන කලාව



- මෙසපොතේමියාවේ ද නයිල් නිම්නයේ ද පැවති ලේඛන කලාව අතර සමානකම් තිබුණු බව දුටුවෙමු.
- එහෙත් ඉන්දු නිම්නයේ ඇති ලේඛන කලාවන් ඉහත කී ශිෂ්ටාචාරවල ලේඛන කලාවන් අතර සම්බන්ධතා නොපෙන්වයි.
- මෙම වෙනස නිසා ඉන්දු නිම්නයේ ඇති අක්ෂර කියවීමට තවම හැකියාවක් ලැබී නැත.
- ඉන්දු නිම්නයේ ඇති ලේඛන කලාවට ඇති සාධක කීහිපයක් නම් මුද්‍රා කිහිපයක ඇති අක්ෂර ස්වල්පය පමණි.
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ගැන ඉගෙනීමට කිසිදු ලිඛිත සාක්ෂියක් එම ශිෂ්ටාචාරයෙන් ලැබී නැත.